# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1406 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திக / Date – 30/08/2024 පැය 1440

## මාධ්‍ය නිවේදනය

**01. මනුෂ්‍ය ඝාතනයක් - දෙහිඅත්තකණ්ඩිය පොලිස් වසම**

2024.08.30 වන දින උදෑසන කාලයේ දෙහිඅත්තකණ්ඩිය පොලිස් වසමේ සේරුපිටිය ප්‍රදේශයේදී පිරිමි පුද්ගලයෙකුට තියුණු ආයුධයකින් ඇන ඝාතනය කර කාන්තාවකට තුවාල සිදු කර රෝහල් ගත කර ඇති බවට දෙහිඅත්තකණ්ඩිය පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 24 ක් වූ සේරුපිටිය, දෙහිඅත්තකණ්ඩිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මෙම ඝාතනය පවුල් ආරවුලක් මත සිදුකර ඇති අතර සැකකාර පියා විසින් තම පුතා සහ ලේලියට තියුණු ආයුධයකින් ඇනීම හේතුවෙන් මෙම අපරාධය සිදුව ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෙ සම්බන්ධව මහේස්ත්‍රාත් පරීක්ෂණය සිදුකර මෘතශරීරය පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා පොළොන්නරුව රෝහල වෙත යොමු කර ඇත. ඝාතනය සම්බන්ධයෙන් සැකකාර පියා අත්අඩංගුවට ගෙන ඇති අතර දෙහිඅත්තකණ්ඩිය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**02. මනුෂ්‍ය ඝාතනයක් සිදු කිරීමට තැත් කිරීමක් සම්බන්ධයෙන් සැකකරුවෙකු අත්අඩංගුවට - ගාල්ල අපරාධ කොට්ඨාසය.**

2024.08.14 වන දින හික්කඩුව පොලිස් වසමේ හෝටලයක් අසලදී යතුරුපැදියකින් පැමිණි පුද්ගලයින් දෙදෙනෙකු විසින් ටී-56 ගිනි අවියකින් පුද්ගලයෙකුට වෙඩි තැබීමට උත්සහ කිරීමක් සම්බන්ධ අපරාධයට අදාළව සැකකරුවෙකු **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 440 ක් සන්තකයේ** තබාගෙන සිටියදී ගාල්ල අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරකට අනුව 2024.08.29 වන දින උදෑසන කාලයේදී හික්කඩුව පොලිස් වසමේ නලාගස්දෙණිය ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන හික්කඩුව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 22 ක් වන නලාගස්දෙණිය, හික්කඩුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

හික්කඩුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි

පොලිස් මාධ්‍ය කොට්ඨාසය.